මාධ්‍ය නිවේදනය

බර්න්2019 දෙසැම්බර් 19

## ස්විට්සර්ලන්තය සහ ශ්‍රී ලංකාව අතර ඉහළ මට්ටමේ සම්බන්ධතා: ෆෙඩරල් මන්ත්‍රී ඉග්නේෂියෝ කැසිස් ශ්‍රී ලංකා විදේශ ඇමතිවරයා අමතා සංවාදය පවත්වා ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රිකයින් එවයි

ස්විට්සර්ලන්තය, වත්මන් අර්බුදය විසඳීම සඳහා ශ්‍රී ලංකාව සමඟ ඉහළ මට්ටමේ සාකච්ඡා දිගටම පවත්වාගෙන යයි. හිටපු ස්විට්සර්ලන්ත තානාපතිවරයෙක් වන ජෝග් ෆ්‍රීඩන් ශ්‍රී ලංකාවට එවන බව දැනුම් දීම සඳහා ෆෙඩරල් මන්ත්‍රී ඉග්නේෂියෝ කැසිස් 2019 දෙසැම්බර් 18 වන දින තම ශ්‍රී ලංකා සමස්ථානිකයාවන විදේශ ඇමති දිනේෂ් ගුණවර්ධන දුරකථනයෙන් ඇමතුවේය. මෙම පළපුරුදු රාජ්‍ය තාන්ත්‍රිකයාගේ නායකත්වය යටතේ කොළඹ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ ආරක්ෂක සිද්ධිය පැහැදිලි කර ගැනීමට කටයුතු කරනු ඇත. ස්විට්සර්ලන්ත ෆෙඩරල් විදේශ කටයුතු දෙපාර්තමේන්තුව (FDFA) සිය කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය හා ආරක්ෂාව ඉතා වැදගත් යැයි සලකන බවත්, ඉදිරි කටයුතු වලදී මේවා තහවුරු කිරීම ශ්‍රී ලංකා බලධාරීන්ගේ වගකීම බවත් කැසිස් මහතා අවධාරණය කළේය.

ගුණවර්ධන මහතා සමඟ කළ දුරකථන සංවාදයේදී කැසිස් මහතා ස්විට්සර්ලන්තයේ ස්ථාවරය සැකෙවින් ඉදිරිපත් කළේය. මෙම ආරක්ෂක සිද්ධිය ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ දේශීය කාර්ය මණ්ඩල සාමාජිකයාගේ සෞඛ්‍යයට දැඩි ලෙස බලපා ඇත. සේවා යෝජකයෙකුගේ කාර්යභාරය තුළ, ෆෙඩරල් විදේශ කටයුතු දෙපාර්තමේන්තුව (FDFA) සිය කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේම සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා ප්‍රමුඛත්වය දෙයි. එහෙයින් සිද්ධියට සම්බන්ධ තානාපති කාර්යාල සේවකයා ද ඇතුළුව ෆෙඩරල් විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ (FDFA) කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා බලධාරීන් වගකිව යුතු බව කැසිස් මහතා සඳහන් කළේය.

ඇයගේ සෞඛ්‍ය තත්වය කිසිදු ආකාරයකින් සැලකිල්ලට නොගෙන අදාළ දේශීය සේවකයා නඩු විභාගයට පෙර රඳවා තබා ගැනීමට මහේස්ත්‍රාත්වරයා ගත් තීරණය පිළිබඳව ද කැසිස් මහතා සිය කණගාටුව ප්‍රකාශ කළේය. එබැවින් මානුෂීය හේතූන් මත ඇය රෝහලක් වැනි වඩාත් සුදුසු ස්ථානයකට මාරු කරන ලෙස ඔහු ගුණවර්ධන මහතාගෙන් ඉල්ලා සිටියේය. සිය තානාපති කාර්යාල කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බලධාරීන් වගකිව යුතු බව ස්විට්සර්ලන්තය සලකයි.

බොහෝ අවධානයට ලක්වී ඇති මෙම නඩුවේදී නීතියේ ආධිපත්‍යය පිළිගන්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ කීර්ති නාමය අවදානමට ලක්ව ඇති බව කොළඹ ස්විට්සර්ලන්ත තානාපති හැන්ස්පීටර් මොක් මහතා අඟහරුවාදා ශ්‍රී ලංකා නීතිපතිවරයා සමඟ පැවති සාකච්ඡාවේදී අවධාරණය කළේය.

පලදායී විසඳුම් සොයමින්

ගුණවර්ධන මහතා සමඟ කළ දුරකථන සංවාදයේ දී කැසිස් මහතා පෙන්වා දුන්නේ, මෙම සිද්ධිය පිළිබද පුළුල් මාධ්‍ය ආවරණයත්, පුද්ගලිකත්වය ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැතිකම, සහ මෙම නඩු විභාගයේ ප්‍රතිඵල පිළිබඳ පූර්ව නිගමනවලට එළඹී කරන ප්‍රසිද්ධ ප්‍රකාශත් ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාවට තර්ජනයක් වූ අතර, දෙරට ඒකාබද්ධව මෙම සිද්ධිය විසඳා ගැනීමට අවශ්‍ය විශ්වාසය හා රහස්‍යභාවයද දුර්වල කර ඇති බවයි.

පළපුරුදු රාජ්‍ය තාන්ත්‍රිකයෙකු හා හිටපු තානාපතිවරයෙක් වන ජෝග් ෆ්‍රීඩන් මහතා කොළඹට එවීමට කටයුතු කලේ ස්විට්සර්ලන්තය, ශ්‍රී ලංකා බලධාරීන් සමඟ මෙම සිද්ධිය පැහැදිලි කර ගැනීමට උනන්දු වන නිසාවෙන් බව කැසිස් මහතා අවධාරණය කළේය.

ෆ්‍රීඩන් මහතා ශ්‍රී ලාංකික බලධාරීන් සමඟ සාකච්ඡා මාර්ගයෙන් එළඹිය හැකි විසඳුම් ගැන සොයා බැලීමට අපේක්ෂා කරන අතර, එමඟින් ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයට සහාය ලබා දෙනු ඇත. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මෙම අතිරේක සම්බන්ධතාවේ අරමුණ වන්නේ ස්විට්සර්ලන්තය සහ ශ්‍රී ලංකාව අතර ඇති විශ්වාසයේ පදනම ශක්තිමත් කිරීමයි.

කැසිස් මහතා සමඟ කළ දුරකථන සංවාදයෙන් පසුව ගුණවර්ධන මහතා අද මොක් මහතා සහ ෆ්‍රීඩන් මහතා හමුවී විසඳුමක් සෙවීමේ අරමුණින් සාකච්ඡාවක් පැවැත්වූයේය. ස්විට්සර්ලන්ත තානාපතිවරු අවධාරණය කළේ මෙම සිද්ධිදී නිර්දෝෂීභාවය පූර්වානුමානය කිරීමේ මූලධර්මය අදාළ වන බවත්, තානාපති කාර්යාල කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය හා ආරක්ෂාව ප්‍රමුඛ වන බවත් ය. ස්විට්සර්ලන්තය ශ්‍රී ලංකාව සමඟ සමීප සබඳතා පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන අතර ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට අවශ්‍ය සහයෝගය ලබා දීමට අපේක්ෂා කරයි.